# රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
# அரச கணக்குகள் திணைக்களம்
# Department of State Accounts

| මගේ අංකය<br>எனது இல.<br>My No. | SA/MAA/02/03/01 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2025.01.03 |
|---|---|---|---|---|---|

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

**රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත මාසික ගිණුම් සාරාංශ මගින් ගිණුම් දත්ත සම්ප්‍රේෂණය කිරීම හා දෙපාර්තමේන්තු ගිණුම් පොත් භාණ්ඩාගාර පොත් සමඟ සැසඳුම් කිරීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් වන මුදල් රෙගුලාසි අංක 426 හා 427 හි සඳහන් විධිවිධාන කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

02. ඒ අනුව, සෑම වර්ෂයක් ආරම්භයේ දීම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් මාසික ගිණුම් සාරාංශ ඉදිරිපත් කළ යුතු දින සඳහන් කරමින් මාර්ගෝපදේශයක් නිකුත් කරනු ලබන අතර සාවද්‍ය දත්ත භාණ්ඩාගාර ගිණුම්වලට ඇතුළත් වීම වළක්වා ගැනීම සඳහා New CIGAS වැඩසටහනට ඇතුළත් කරනු ලබන දත්ත පරීක්ෂා කර නිවැරදි තොරතුරු පමණක් එවීමට අදාළ නිලධාරීන් වග බලාගත යුතු ය.

03. තව ද, මු.රෙ. 427(3) අනුව භාණ්ඩාගාරයේ පොත්වල සහ දෙපාර්තමේන්තු පොත්වල ගිණුම් අතර වන විෂමතාවයන් දෙපාර්තමේන්තුවේ වරදකින් සිදු වූ විට අදාළ වරද නිවැරදි කර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු යොදා ගත යුතු අතර එම විෂමතාවය භාණ්ඩාගාරයේ වරදකින් සිදුවූවක් නම් පමණක් භාණ්ඩාගාර පොත්වල අදාළ වරද නිවැරදි කිරීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැන්විය යුතු ය.

04. එසේ වුව ද, සමහර ආයතන විසින් යම් මාසයක ගිණුම් සාරාංශ ඉදිරිපත් කිරීමෙන් අනතුරුව හඳුනාගන්නා දෝෂයන් ඊ ළඟ මාසයේ ගිණුම් සාරාංශය මගින් නිවැරදි කර ගැනීමට කටයුතු නොකර ආයතනයේ New CIGAS පද්ධතියේ පමණක් නිවැරදි කිරීම් සිදුකර, භාණ්ඩාගාර පොත්වල වෙනස්කම් නිවැරදි කිරීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ජර්නල් සටහන් ඉදිරිපත් කරන අවස්ථාවන් බොහොමයක් මෑත කාලයේ දී නිරීක්ෂණය වී ඇත.

05. එබැවින්, ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් විසින් මේ පිළිබඳව තම පෞද්ගලික අවධානය යොමු කර කටයුතු කරන ලෙස ද ඉදිරියේ දී එක් එක් ආයතන විසින් සිදුකරනු ලබන වැරදි නිවැරදි කිරීම් සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ජර්නල් සටහන් ඉදිරිපත් කිරීමෙන් වැළකී අදාළ ආයතනවල ගිණුම් සාරාංශ මගින් වැරදි නිවැරදි කර ගැනීමට කටයුතු කරන ලෙස ද කාරුණිකව දන්වමි.

ඩබ්.ඒ. සමන්ත උපනන්ද

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත:

01. විගණකාධිපති


මහා භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව පொது திறைசேரி, கொழும்பு 01, இலங்கை. General Treasury, Colombo 01, Sri Lanka.
General-Tel.: +94 11 2484500/600 Ext.: 1149
Director General - Tel.: +94 11 2484728
Fax: +94 11 2484869
Fax: +94 11 2473856
Website: www.sad.gov.lk
e - mail : dgsa@sad.treasury.gov.lk